මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\53 2023.07.04

**2023.06.26 දින රැස්වූ මැතිවරණ කොමිෂන් සභාව පහත සඳහන් නිවේදනයන් නිකුත් කර සිටී.**

2020 දෙසැම්බර් 10 වන දින පත්වීම් ලැබූ දෙවන මැතිවරණ කොමිෂන් සභාව වසර දෙකක් හා මාස 07ක කාලයක් පමණ කටයුතු කරනු ලැබූ අතර, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාව විසින් නව කොමිෂන් සභාවක් පත් කිරීමත් සමඟ මෙකී කොමිෂන් සභාවේ ධූර කාලය අවසන් වීමට නියමිතය.

එම කාලය තුළ නිදහස් හා සාධාරණ මෙන්ම ප්‍රශස්ත මැතිවරණ ක්‍රියාවලියක් මෙහෙය වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් විවිධ ක්‍රමෝපායන් හඳුන්වා දුන් අතර, අටළොස්විය සපුරන යෞවනයනට එකී අවස්ථාවේ සිටම ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ලැබෙන පරිදි ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කර ගැනීම සඳහා ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම හා මැතිවරණ ප්‍රචාරණ වියදම් පාලනය පිණිස පාර්ලිමේන්තු පනතක් සම්මත කර ගැනීම එහි දී ලබා ඇති ප්‍රතිඵල වේ. ඒ සම්බන්ධ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලට එහි ප්‍රශංසාව හිමිවනු ඇත. එසේම පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදය, අපේක්ෂකයන් හා මහජන නියෝජිතයන් සඳහා නීතියෙන් බලාත්මක ආචාර ධර්ම පද්ධතියක් ප්‍රකාශ කර ගැනීම, ඡන්ද විමසීම් අවස්ථාවක දී සියලුම මාධ්‍ය නියාමනයට යටත් කිරීම ආදී ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ නීති සංශෝධන නීති කෙටුම්පත් කිරීමේ අවස්ථාව දක්වා පැමිණ ඇත. මේ සියලු කාර්ය මැතිවරණ කොමිෂන් සභාවේ සාමූහික ක්‍රියාකාරීත්වය මත ළඟා කරගත හැකි වූ අතර, ඒ සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලය, දිස්ත්‍රික්කවල නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගෙන්, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ගෙන්, නීතිපති දෙපාර්තමේන්තුව, අමාත්‍යාංශ සහ සෙසු රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් ලද සහාය බෙහෙවින් අගය කළ යුතුය. එසේම මැතිවරණ කොමිෂන් සභාවේ හවුල්කාර සංවිධාන වන සියලුම දේශපාලන පක්ෂ, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන, සිවිල් සංවිධාන, මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන්, කාන්තා, තරුණ හා ආබාධිත සංවිධානවලින් ලද සහාය නොවන්නට මෙම කාර්යයන් ඉටුකර ගැනීමේ හැකියාව නොලැබී යා හැකිව තිබුණි. එසේම ජාත්‍යන්තර මැතිවරණ පද්ධති පිළිබඳ ආයතනය (IFES) ලබාදුන් තාක්ෂණික සහාය ඉමහත්ය. මෙම අවස්ථාවේ එම සියලුමදෙනා වෙත මැතිවරණ කොමිෂන් සභාවේ කෘතවේදීත්වය හා ගෞරව පූර්වක ප්‍රණාමය පුද කිරීමට ද කැමැත්තෙමු.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්